**ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 2020**

------------------------------------------

## 1.1 මතය

---------

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ("බැංකුව") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය ,විස්තීරණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශනසම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුව සහ සමූහය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවාදුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.කෙසේ වුවද,අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හාඅවශ්‍යා ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේකාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ,බැංකුව ක්‍රියාකර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;
- සම්පත් සකසුරුවම් ලෙස,කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අතින් පිළියෙල කිරීම පිළිබඳ අර්ථකථනයේදී ඉහල අවදානමක් ඇත. ප්‍රධාන කාර්යාලය සඳහා ශේෂ පිරික්සුමක් සහ ශාඛා ශේෂ පිරික්සුමක් වශයෙන් වෙනම ප්‍රධාන ශේෂ පිරික්සුම් 2 ක් පිළියෙල කරනු ලබයි.සියළුම ශාඛාවන්හි ශේෂ පිරික්සුම් සීබීඑස් පද්ධතිය තුළින් උපුටා ගෙන එය එක්සෙල් පැතුරුම්පත් (MS excel spread sheet) ආකෘතියකට හරවා තනි ශාඛා ශේෂ පිරික්සුමක් උපදවයි. ප්‍රධාන කාර්යාලීය අංශ වල ශේෂ පිරික්සුම් වෙනම ලබා ගන්නා අතර ඒවා ප්‍රධාන කාර්යාලීය තනි ශේෂ පිරික්සුමකට සම්බන්ධ කරනු ලබයි.අවසානයේදී ශේෂ පිරික්සුම් දෙකම භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි. | දැනට ශාඛා පොදු ලෙජරය හා ප්‍රධාන කාර්යාල පොදු ලෙජරය වෙනම පොදු ලෙජර පද්ධතියක් ලෙස පවත්වා ගෙන යනු ලබයි.කෙසේ වෙතත් ගණුදෙනු අතින් පිළියෙල කිරීම පිළිබඳ අර්ථකථනයේදී තනි පොදු ලෙජර පද්ධතියට ගණදෙනු හසුකර ගැනීමේදී සහ වාර්තා කිරීමේ සුරක්ෂිතභාවය සඳහා අවශ්‍ය පාලන ක්‍රම සුදුසු ලෙස පවත්වා ගනු ලබයි.<br>මූල්‍ය ප්‍රකාශන වල නිරවද්‍ය තාවය සහතික කිරීම සඳහා උචිත පාලන ක්‍රම ක්‍රියාත්මක වන අතර සියළුම ශේෂ පිරික්සුම් පොදු ලෙජර පද්ධති හා එක්සෙල් පැතුරුම්පත් හරහා උපදවමින් ඒවා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරනු ලබයි.තවද හර බැංකුකරණ විසඳුම (Core Banking Solution) දැනටමත් ආරම්භ කර ඇති අතර එමගින් පවත්නා පද්ධතියේ අතින් පිළියෙල කිරීමේ අඩුපාඩු වළකා ගත හැක. | බැංකුව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අතින් පිළියෙල කිරීම පිළිබඳ අර්ථකථනය අවම කරගත යුතුය. |

### 1.5.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අන්තර් ශාඛා පාලන ගිණුමේ ශුන්‍ය අගයක් ගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට එහි රු.218,733,468 ක ශේෂයක් පවතින අතර එහි ප්‍රධාන කාර්යාලීය අප ගිණුම, ශාඛා ජංගම ගිණුම් සහ ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර පියවීමේ ගිණුම් ආදී ප්‍රමාණාත්මක ශේෂයන් ඇතුලත් වේ. | ගිණුම් වාර්තාකරන දිනට මාර්ගස්ථ ගණුදෙනු තිබීම හේතුවෙන් ශාඛා අතර ගිණුම්වල හර හා බැර ශේෂ තිබිය හැකි අතර එය අනුපිළිවෙලින් නිරවුල් කෙරේ. | නොකඩවා සැසඳීම් කළ යුතුය. |

**1.6 ලැබියයුතුහාගෙවියයුතු ගිණුම්**

**1.6.1 ලැබීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020දෙසැම්බර් 31 දිනටවංචනික ලෙස තැන්පතු ආපසු ලබා ගැනීම් වලින් බැංකුවට ලැබිය යුතු මුදල රු. මිලියන 134.4 කි.ඒ අතරින් රු.103,963,153 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.තවද, රක්ෂණයෙන් හෝ වෙනත් අයකරගැනීමේ ක්‍රමයකින් අයකර නොගත් රු.77,292,906 ක ශේෂයක් පවතී. | 2021 සැප්තැම්බර් 30 දිනට වංචනික ලෙස තැන්පතු ආපසු ලබා ගැනීම් වලින් ලැබිය යුතුවටිනාකමෙහි වර්තමාන තත්වය රු. මිලියන 87.6 ක් වන අතර විය හැකි අලාභ සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකර ඇත.<br>කළමනාකරණ අංශය විසින් වංචනික තැන්පතු ආපසු ගැණුම් ගිණුම සම්බන්ධව නොකඩවා පසු විපරම් කරමින් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර ඇත.<br>තවද අනෙකුත් රක්ෂණ හිමිකම්වලට අමතරව වර්ෂ 5 ක් ඉක්මවන වංචා සඳහා පාරිතෝෂික ගෙවීම් ලෙස රු. මිලියන 15 ක් 2020 හා 2021 වර්ෂයන්හිදී ලැබී තිබුණි.<br>2021 වර්ෂයේදී රු. මිලියන 2 ක් හා 2020 වර්ෂයේදී රු. මිලියන 42 ක මුදලක් මුළු රක්ෂණ හිමිකම් වශයෙන් ලැබී තිබුණි.<br>තවද, බැංකුව විසින් චක්‍රලේඛ හඳුන්වා දෙමින් දැඩි පරීක්ෂා කිරීම් හා අභ්‍යන්තර විගණන සිදුකරමින් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කර ඇත. | කාර්ය මණ්ඩලය විසින් සිදුකර ඇති වංචා සඳහා විනය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර , වංචා අවම කරගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත<br>(i) 47 වන වගන්තිය | වර්ෂ 10 කට වඩා කාලයක් අක්‍රියවපවත්නාතැන්පතු "හිමිකම්නොපෑතැන්පතු සංචිත"ගිණුමට මාරු කළ යුතුය. කෙසේ වුවද , එම සංචිත ගිණුමට මාරුකිරීමෙන් තොරව රු. මිලියන 836.48 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලඅක්‍රියලෙස පැවතුණි. | බැංකුව විසින් 2020 වර්ෂයේදී අක්‍රිය ගිණුමේ බැරට පවතින හිමිකම් නොපෑ තැන්පතු ගිණුමට රු.මිලියන 1,521 ක් මාරු කරතිබුණි.<br>ගනුදෙනුකරුවන්ට කාලීනව (වාර්ෂිකව)අනුපිළිවෙලින් සිදුකරන ලද ගෙවීම් ඉහළ ප්‍රතිශතයක් ගැනිම හේතුවෙන් ඉතිරි ශේෂ ඉදිරි වර්ෂය තුලදී මාරුකිරිමට සලකා බලනු ඇත. | බැංකුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 47 (4) වන වගන්තිය | බැංකුව විසින් හිමිකම් නොපෑ තැන්පතු සංචිතයටමාරු කල මුදලින් ගණුදෙණුකරුවන්ට කළ ගෙවීම්,භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කරගත යුතුය. කෙසේ වෙතත් බැංකුව විසින් 2000 - 2020 දක්වා කාලය ඇතුලත ගණුදෙණුකරුවන්ට ගෙවා තිබුණරු. මිලියන 703.13 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | මේ වන විටත් භාණ්ඩාගාරයට ඉල්ලීම් කර ඇති අතර ඒ පිළිබඳ පසු විපරම් කරනු ලැබේ. | බැංකුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉකුත් වර්ෂයේ අනුරූපීශුද්ධ ලාභය රු. මිලියන 6,381 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේමෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 10,107 කශුද්ධ ලාභයක් වේ. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 3,727 ක් හෙවත් සියයට 58 ක වැඩිදියුණුවීමක් නිරීක්ෂණය විය.ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශුද්ධ පොලී ආදායම, ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම,මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් වන ශුද්ධ ලාභය වැඩිවීම ඉහත වැඩිදියුණුවීමට බලපෑ හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්හි උපනති විශ්ලේෂණය
-----------------------------------------------------------------------

අඩුවීම් හා වැඩිවීම් ප්‍රතිශතය සමගසමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ආදායම් හා වියදම්අයිතමයන්හි විශ්ලේෂණය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| විස්තරය | විචලන වටිනාකම වැඩිවීම/(අඩුවීම) (රු.'000) | විචලනය % | විචලනයට හේතු |
|---|---|---|---|
| ශුද්ධ පොලී ආදායම | 6,058,167 | 21 | රු. මිලියන 12,254 කින් ණය සහ වෙනත් උපකරණ මත පොළී ආදායම වැඩිවීම,2020 දී පිළිවෙලින් බැංකුවලට ගෙවියයුතු හා වෙනත් ණය ගැනීම් මත ගෙවිය යුතුරු. මිලියන 4,023 කින් හා රු. මිලියන 4,567 කින් පොළී වියදම අඩුවීම |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 1,426,687 | 126 | ණය සම්බන්ධ සේවාවන් ගෙන් ජනිත වන ගාස්තු හා ආදායම වැඩිවීම |
| ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම | 385,188 | (91) | විදේශ විනිමය ප්‍රත්‍යාගණනය මත ලාභය රු. මිලියන 107 ක සීඝ්‍ර අඩුවීම සහ ලාභාංශ ආදායම රු. මිලියන 202 කින් වැඩිවීම |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ වියදම | 4,297,780 | 782 | ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ණයහාඅත්තිකාරම් වටිනාකම මත |

| | | | |
|---|---|---|---|
| | | | හානිකරණ වෙන්කිරීම රු. මිලියන 4,304 කින් හෙවත් සියයට 61 කින් වැඩිවීම |
| එකතු කිරීමේ අගය මතබද්ද,ජාතිය ගොඩනැගීමේ බද්ද, ණය අයකරගැනීමේ බද්ද ඇතුලත් මුළු වියදම් | (1,619,847) | (8) | ජාතිය ගොඩනැගීමේ බද්ද හා ණය අයකරගැනීමේ බද්ද ඉවත් කිරීම හේතුවෙන්, 2020 දී මෙම වියදම රු. මිලියන 2,151 කින් අඩුවීම |

## 2.3 අනුපාතවිශ්ලේෂණය

-------------------------

ලබාගතහැකිවුතොරතුරුඅනුවසමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේසමහරවැදගත්අනුපාතපහතදැක්වේ.

| විස්තරය | ආංශිකඅනුපාතය* | බැංකුව 2020 | බැංකුව 2019 |
|---|---|---|---|
| **ලාභදායිකත්ව අනුපාත** | | | |
| හිමිකම් මත ප්‍රතිලාභය (ROE) | 16.7 | 20.67 | 14.34 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 1.3 | 1.24 | 0.95 |
| පොලී ආන්තිකය | 3.4 | 2.77 | 2.63 |
| **වත්කම්වලගුණාත්මකඅනුපාතය** | | | |
| දළඅක්‍රීය අත්තිකාරම් (NPL) | 6.8 | 2.79 | 1.57 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත** | | | |
| Basel 111 – පෙළ 1 (අවමය 8%) | 11.8 | 13.65 | 13.49 |
| Basel 111 – මුළු (අවමය 12%) | 14.8 | 16.45 | 15.82 |
| **ද්‍රවශීලතා වත්කම් අනුපාතය** | 60.4 | 69.1 | 60.2 |

***ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ තොරතුරු වලින් උපුටාගෙන ඇත.**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී2020 වර්ෂයේදී බැංකුවේ හිමිකම්මත ප්‍රතිලාභය (ROE) සහ වත්කම් මත ප්‍රතිලාභය(ROA) පිළිවෙලින් සියයට 6.33 කින් සහ සියයට 0.29 කින් වැඩි වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී2020 වර්ෂයේදී ද්‍රවශීලතා වත්කම් අනුපාතයද සියයට 8.9 කින් වැඩි වී තිබුණි. තවද එම අනුපාතයසියයට 60.4 ක් වන කර්මාන්තයේ සාමාන්‍යයට වඩා වැඩිය.

(iii) 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 16.45 ක් ලෙස වාර්තා වු අතර එය සියයට 14.8 ක් වන අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට වඩා මදක් වැඩිය.

(iv) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී2020 දී බැංකුවේශුද්ධ පොලී ආන්තිකය සියයට 0.13 කින් වැඩි වී තිබුණි.කෙසේ වෙතත්පොලී ආන්තිකය සියයට3.4 ක් වන කර්මාන්තයේ සාමාන්‍යපොලී ආන්තිකයටවඩා අඩුය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ආර්ථික නොවන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2008 වර්ෂයේදී මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා වෘත්තීය සේවාවන් ලබාගැනීම වෙනුවෙන් රු. මිලියන 35.23 ක මුදලක් වැය කර තිබුණි.කෙසේ වෙතත් මෙම ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබු අතර ඒ වෙනුවෙන් දරා ඇති වියදම ඵල රහිත වියදමක් බවට පත් වීම සහ එම ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. | මහල් 18 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (සීඊසීබී) ඇතුලත්ව බාහිර වෘත්තීය ආයතන සමගින් වන අතර ඔවුන්ගේ වෘත්තීය සේවාවන් සඳහා ගෙවන ලද ගෙවීම් මෙම ප්‍රාග්ධන වියදම නියෝජනය කරයි.<br>ප්‍රධාන කාර්යාල බිමෙහි විශාල සංවර්ධන කටයුත්තක් සැලසුම් කිරීමට මෙයට යාබදව ඇති පර්චස් 106 ක ඉඩම දිගුකාලීන බදු පදනම මත ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කෙරෙමින් පවතී.<br>ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සේවය ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලමින් හා ඒ අනුව ඔවුන් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුවහොත්<br>නව ව්‍යාපෘතිය සඳහා සේවා ගාස්තු සුදුසු ලෙස අඩුකරගැනීම වෙනුවෙන් ඔවුන් සමග සාකච්ඡා කරනු ඇත.<br>තවද, ඕනෑම වියහැකි අලාභයන් සඳහා 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 35.23 ක වෙන් කිරීමක් දැනටමත් සිදු කර ඇත. | මෙම ගනුදෙණුව හරහා බැංකුවට වන අලාභය අවම කරගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| 01 | 2021 ජනවාරි මාසයේදි අභ්‍යන්තර විගණන අංශය විසින් ශාඛා 258 ක සිදු කරන ලද පරික්ෂණයකට අනුව හිඟ වටිනාකම රු.195,365,919 ක් වු ණය ලිපි ගොනු 390 ක් අස්ථාන ගත වී තිබුණි. | වර්ෂයකට දෙවතාවක් දෙසැම්බර් 31 හා ජුනි 30 දින හෝ අවට කාලය තුල තම ශාඛාවන්හි ණය ලිපිගොනු සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කරන ලෙස ශාඛා කළමනාකරුවන්/ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත දැනටමත් උපදෙස් ලබා දී ඇත. | ණය ලිපිගොනු පවත්වාගෙන යාම උදෙසා අභ්‍යන්තර වැඩපිළිවෙල ශක්තිමත් කළ යුතුය. |
| | අ. අස්ථානගත වු ලිපි ගොනු අතරින් ණය වටිනාකම රු.29,846,707 ක් වු ලිපිගොනු 100 ක් අක්‍රිය ණය | එයට අමතරව ශාඛා වෙත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) ගේ අංක 469/2018 දරන උපදෙස් ලිපිය හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිගේ අංක | |

| | | | |
|---|---|---|---|
| | ලිපිගොනු වේ. එම අක්‍රීය ගණයේ අස්ථානගත ණය ලිපිගොනු 100 වටිනාකම පිළිවෙලින් රු.1,506,770, රු.19,032,365 සහ රු.9,307,572 ක් වන නීති ලිපි ගොනු 2 කින් , නිවාස ණය ලිපිගොනු 38 කින් හා පෞද්ගලික ණය ලිපිගොනු 60 කින් සමන්විත වේ. | 535/2019 දරන උපදෙස් ලිපිය මගින් මෙම ණය ලිපිගොනුවල ආරක්ෂිත වැදගත්කම හා අදාල උපදෙස් වලට අනුගත වීම පිළිබඳ උපදෙස් තවදුරටත් නිකුත් කර තිබුණි.<br>ණය ලිපිගොනු වල වැදගත්කම හා ආරක්ෂාව පිළිබඳ යම් දෝෂ තිබුණහොත්, එම තත්වය පිළිබඳ යාන්ත්‍රණය ශාඛා කාර්යමණ්ඩලය දැනුවත් කරමින් හා 2022 වර්ෂය සඳහා කාර්යමණ්ඩල පුහුණු සැසි පවත්වමින් අඩු කරගැනීමට කටයුතු කරනු ඇත. | |
| | ආ. වාර්තා ගත දිනය දක්වා අස්ථානගත ලිපිගොනු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව බැංකුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය හරහා පවතින අභ්‍යන්තර පාලන පද්ධතියේ අඩුපාඩු හා දුර්වලකම් හඳුනා ගෙන ඔවුන්ගේ නිර්දේශ මත යෝජිත Core Banking පද්ධතිය සමගාමීව සුදුසු යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය.<br>පසුගිය මාස කිහිපය තුල Covid -19 වසංගත ව්‍යාප්තියට මුහුණ දෙමින් රජය පැනවූ විවිධ සීමාකිරීම් මත කාර්යමණ්ඩල සාමාජිකයන් රාජකාරියට වාර්තාකිරිම නිසා අස්ථානගත ලිපිගොනු සෙවීමේ මෙහෙයුම් කටයුතුවල ප්‍රමාදයක් විය.කෙසේ වෙතත් කාර්යමණ්ඩල සාමාජිකයන් විසින් වර්තමානයේදී ඔවුන් විසින්ම ශක්තිමත්ව එම අස්ථානගත ලිපිගොනු 6 සෙවීමේ මෙහෙයුම්වල නිරතව සිටී. | |
| **02** | අංක 739/2009 දරන චක්‍රලේඛය ප්‍රකාරව දින 21 ක වරප්‍රසාද නිවාඩු අතරින් නිවාඩු දින 7 ක් අනිවාර්යයෙන් එක දිගට ලබාගත යුතුය. එසේ වරප්‍රසාද නිවාඩු දින 07 ක් එක දිගටලබාගනු ලබන සේවකයන් සඳහා ඔහුගේ වරප්‍රසාද නිවාඩු වලින් තවත් දින 7 ක මුදල් කිරිමට අවසර ලබාදේ. කෙසේ වුවත් සාමාන්‍යාධිකාරිගේ 2020 අගෝස්තු 21 දිනැති අංක 1949/2020 දරන නව චක්‍රලේඛයට අනුව 2020 වරප්‍රසාද නිවාඩු දින 07 ඊළඟ 2021 හා 2022 වර්ෂවලදි භාවිතා කිරිමට හා යම් සේවකයකු විසින් අනිවාර්ය දින 7 ක නිවාඩුව ලබා නොමැති නම් වුවද ඉතිරි වරප්‍රසාද නිවාඩු වලින් උපරිම දින 07 ක් මුදල් කිරිමට ඉඩ ලබා දේ. | Covid -19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය ඇතුලත මාස 03 කට ආසන්න කාලයක් රට වසා දමා තිබුනි. තවද නිවස තුල සිට රාජකාරි කරන අතරතුර වර්ෂයේ පසු කාලය තුල සේවකයන් රාජකාරි සඳහා පැමිණියේ සේවාමුරපදනමකට අනුවයි. ඊට අමතරව Covid -19 අවදානම හේතුවෙන් ගර්භණී තත්වයේ පසුවන කාර්ය මණ්ඩලය හා අසාධ්‍ය තත්වයේ පසුවන කාර්ය මණ්ඩලයද නිවසේ සිට වැඩ කිරීම සඳහා ඉල්ලීම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයන් හට නිතිපතා පදනම යටතේ රාජකාරි සඳහා වාර්තා කල නොහැකි වු අතර සහ ඔවුන්ගේ නිවාඩු හිමිකම් භාවිතා නොකර එසේම පැවතුණි.<br>එපමණක් නොව බැංකුව විසින් 2020 වසරේදි සේවකයන් දින 07 අනිවාර්ය නිවාඩු යවා තිබුණේ නම් එය බැංකුවේ මෙහෙයුම් වලට අහිතකර ලෙස බලපා හැකිව තිබුණ අතර සේවකයන් සේවා මුර පදනම මත වැඩ කිරීම | අනිවාර්ය නිවාඩු දින 07 ලබා ගැනීමෙන් තොරව එය දිගු කිරීම එහි අරමුණ සාක්ෂාත් නොකරන අතර එම නිවාඩු ලබන වසර දක්වා ඉදිරිය ගෙන යාම බැංකුවේ දිනපතා මෙහෙයුම් පවත්වාගෙන යාම කෙරෙහි බලපායි. එහෙයින් මෙවැනි තීරණයක් ගැනීමට පෙර කාර්යමණ්ඩල දායකත්වය බැංකුවට ලබා ගැනීම පිළිබඳ කළමනාකාරිත්වය තම අවධානය යොමු කල යුතුය. |

| | |
|---|---|
| Covid 19 වසංගත කාලය තුල බොහෝමයක් සේවකයින් රාජකාරියට වාර්තා නොකිරීම නිසා එවැනි විශේෂ තත්වයකදි එවැනි ස්වභාවයේ තීරණ අනුමත කල නොහැක. | හා ගමන් සීමා පනවා තිබීමද වැඩවල පසු බැමක් ඇති වීමට බලපා තිබුණි.<br>Covid -19 වසංගතය මුළු රටටම බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ නොවැලැක්විය හැකි හේතූන් මත සේවකයන්හට රාජකාරි සඳහා වාර්තා කළ නොහැකි වූ නිසා සේවකයන්ගේ අනිවාර්ය දින 7 නිවාඩු ගැනීමේ අයිතිය 2022 දෙසැම්බර් 31 දින දක්වා ඉදිරියට ගෙන යාම සඳහා ඉඩදීමට කළමනාකාරිත්වය තීරණය කර තිබුණි. මෙම තීරණය ගනු ලැබුවේ අනෙකුත් බැංකු විසින් අනුගමනය කරන ලද භාවිතයන්ද සමගාමීව සලකා බැලීමෙනි. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| 1 | අ) සමාලෝචිත වර්ෂය තුල ශාඛා 259අතරින්, 7ක්අලාභලබනශාඛාලෙසහඳුනාගෙනතිබුණි. ඒවාඅතරින් කතරගම,කටුවන සහ වැලිවේරිය ශාඛා 2020 වර්ෂය ඇතුලත විවෘතකරතිබුණි.දෙයියන්දර ,පොතුවිල් සහමාකොළශාඛාවන්ද 2020 වර්ෂයේදී අලාභ ලබා තිබුණි.කෙසේ වෙතත් එම අලාභ ඉකුත් වර්ෂය හා සැසඳීමේදී අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදීඅක්කෙරයිපත්තුශාඛාවේ අලාභයරු.141,184 කින් වැඩි වී තිබුණි. | සාමාන්‍යයෙන්ශාඛාවක්විවෘතකිරීමෙන්පසුලාභලැබීමටවසර 03 ක්පමණගතවේ.<br>ඒඅනුව, කතරගම, කටුවන සහ වැලිවේරිය ශාඛා මෙම වර්ෂ 03 කකාලයඉක්මවානැත.<br>කෙසේ වෙතත් 2021 නොවැම්බර් 30 දිනට කතරගම හා කටුවන ශාඛාවල අලාභය අඩුවී ඇති අතර අලාභ ලබන සියළුම ශාඛා සමීපව නිරීක්ෂණය කෙරේ.<br>2020 වර්ෂයේදී අලාභලැබුශාඛාවන් අතරින් දෙයියන්දර, මාකොළහා අක්කෙරයිපත්තුශාඛා 2021 නොවැම්බර් 30 දින වන විට ලාභ ලබා ඇත. | අලාභ ලබන සියළුම ශාඛා සමීපව නිරීක්ෂණය කළ යුතුය. |
| | ආ) සමාලෝචිත වර්ෂයේ දී බැංකුවේ **ණයඅංශය රු. 48,706,065 ක ලාභයක් ලබා තිබුණ අතර එය ඉකුත්** වර්ෂයේ දී ලබා තිබූ රු.677,808,076 ක ලාභය හා සැසඳීමේදී සියයට 92.8 ක පහත වැටීමකි. | ණය අංශයේ ලාභය පහත වැටීමට හේතුව පොළී ආදායම අඩුවීමයි. මෙයට හේතු වූයේ 2020 වර්ෂයේ පැවතිපහළ වෙළඳපල පොළී අනුපාතයයි. **ඊට අමතරව ණය අංශයෙන් අයකළ පොළී පිරිවැය ( ප්‍රධාන කාර්යාල පොළී අනුපාතය) වර්ෂ 2 වෙනුවෙන් නොවෙනස්ව පැවතුණි.** | බැංකුව විසින් ණය ලබාදීමේ ක්‍රියාවලිය හා අයකරගැනීමේ ක්‍රියාවලිය ඵලදායීව පවත්වා ගනිමින් ලාභය පිළිගත හැකි මට්ටමක පවත්වා ගත යුතුය. |
| 2 | බැංකුව විසින් 1983 වර්ෂයේ සිට වාර්ෂිකව තැපැල්පති වෙත ඔවුන්ගේ සේවාව වෙනුවෙන් සේවා ගාස්තු ගෙවනු ලබයි. වර්තමානයේදි එම සේවා ගාස්තුව 2013 වර්ෂයේ පදනම් අගය පාදක කොට ගෙන ස්ථාවර කර ඇති | ජාතික ඉතිරිකිරිමේ බැංකුව විසින් තැපැල් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාව වෙනුවෙන් වාර්ෂික සේවා ගාස්තු ගෙවනු ලබයි. තැපැල්පතිතුමාගේ අනුමැතිය අනුව සේවා ගාස්තු ගෙවීම් සඳහා භාවිතා කරන පවත්නා ක්‍රමවේදය සංශෝධනය කිරීම | තැපැල්පති වෙත ගෙවනු ලබන සේවා ගාස්තුව ගණනය කිරිමේදි බැංකු විසින් සාධාරණ පදනමක් භාවිතා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර එම අගය වර්ෂයේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව වාර්ෂික උද්ධමනය අනුව ගලපනු ලබයි. තැපැල්පති වෙත ගෙවන සේවා ගාස්තුව 2016 වර්ෂයේ රු මිලියන 128 සිට 2020 දි එය රු මිලියන 160.4 දක්වා වැඩිවී ඇත.<br>සේවා ගාස්තු ගණනය සඳහා සාධාරණ පදනමක් භාවිතා නොකර (තැපැල් තැන්පතු, තැපැල් ආපසු ගැනීම් හෝ වෙනත් සාධාරණ පදනමක්) බැංකුව විසින් ඉහත සඳහන් 1983 දි කල සාකච්ඡා සටහන් වෙත අනුකුල වෙමින් හෝ ජාතික පරිභෝගික මිල දර්ශකය භාවිතා කරමින් සේවා ගාස්තු ගණනය කරයි. | අවශ්‍ය වේ. | |
| 03 | 2020 දෙසැම්බර් 31 දිනට තැපැල්පති වෙතින් ලැබිය යුතු නොසැසඳු ශේෂය රු.22,459,556 කි. | නොසැසඳු ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | එම ශේෂයන් කාලීනව සැසඳිය යුතුය. |

**3.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනුරාධපුරඇල්පිටිය, ගල්නෑව, කතරගම,කිරිදිවැල,මොණරාගල,රත්නපුර, කැකිරාව යනප්‍රදේශවලපිහිටි ඉඩම් අටකනෛතිකඅයිතියලබානොගෙන බැංකුවවිසින් එම ඉඩම්වලඉදිකිරීමසඳහාරුපියල්මිලියන 83.6 කමුදලක්වැයකරතිබේ. මෙම විගණන නිරීක්ෂණය 2014 වර්ෂයේ සිට වාර්තා කර තිබූ අතර එම වර්ෂයට පෙරමෙම ගොඩනැගිලි ඉදිකර තිබුණි.ඒවායේ නෛතිකඅයිතියලබාගැනීමට ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමගසාකච්ඡා කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝගයක් නිකුත් කර ඇත. කෙසේ වෙතත් බැංකුවවිසින්2020 වර්ෂයේ අවසානය වන විටත් එම ඉඩම්වල නෛතිකඅයිතියලබාගෙනනොතිබුණි. | <u>අනුරාධපුර</u><br>නාගරික කොමසාරිස් විසින් එවන ලද ලිපිලේඛන බැංකුවවිසින් නිසි පරිදි පුරවා තිබුණි. 2021 ඔක්තෝබර් 22 දින වර්තමාන තත්වය පිලිබඳ ඉල්ලා ඇති අතර පසුවිපරම් කටයුතු සිදුවෙමින් පවතී.<br><br><u>ඇල්පිටිය</u><br>ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇල්පිටිය ශාඛාව විසින්සකස් කිරීමේ ගාස්තු ගෙවා ඇති අතර 2021 ජුලි 16 දින ප්‍රාදේශීයලේකම් විසින් එය මිනින්දෝරු දෙපාර්තමේන්තුවට යවා ඇති බවට ප්‍රතිචාර දක්වා ඇත.<br><br><u>ගල්නෑව</u><br>ප්‍රාදේශීයලේකම්කාර්යාලයේඉල්ලීමපරිදිසාමාන්‍යාධිකාරි විසින්දිගුකාලීනබද්දටළඹීමසඳහාකැමැත්තසඳහන් ලිපියක්නිකුත්කරතිබේ. 2020 මාර්තු 3 දින සිහිකැඳවීම් යවා ඇති අතර 2021 මැයි 17 දින සහ 2021 ඔක්තෝබර් 22 දින තවදුරටත් සිහිකැඳවීම් යවා ඇතිඅතර පසුවිපරම් කටයුතු සිදුවෙමින් පවතී. | බැංකුවවිසින් 2014 වර්ෂයේ සිට බදු අයිතියලබාගැනීමට උත්සාහ කර ඇත.<br>මෙම ඉඩම් සඳහා බදු ගිවිසුම් ලබාගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

**<u>කතරගම</u>**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කල්බද්ද පිළිබඳ නියමයන් හා කොන්දේසි කතරගමදේවාලයේ බස්නායක නිලමේ වෙත දන්වා ඇත. කල්බද්දපිළියෙල කිරීමට හා එය අනුමැතිය සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙස තවදුරටත් දැනුම් දී ඇත.

<u>කැකිරාව</u>

දිගුකාලීනකල්බදු ගිවිසුමකට එළඹීමට යටත්ව ඉඩම භාවිතා කිරීමට කැකිරාව ප්‍රාදේශීයලේකම්වීසින් ඔවුන්ගේ 2020 ජුනි 18 දින ලිපිය මගින් බැංකුව වෙත අනුමැතිය ලබාදී ඇත. 2021 ඔක්තෝබර් 22 දින වර්තමාන තත්වය පිලිබඳ ඉල්ලා ඇත.

<u>කිරිඳිවැල</u>

**දොම්පේ**

ප්‍රාදේශීයලේකම්කාර්යාලයවීසීන්දිගුකාලීනකල්බදු ක්‍රමයක්සකස්කිරීමපිළිබඳවඉඩම්කොමසාරිස්ජනරාල්දෙපාර්තමේන්තුවටදැනුම්දීතිබේ. 2019 ඔක්තෝබර් 15 දින , 2021 මැයි 17 දින සහ 2021 ඔක්තෝබර් 22 දින සිහිකැඳවීම් යවා ඇත.

**<u>මොණරාගල</u>**

2020 වර්ෂයටඅදාළබිම්කුලීබැංකුවවිසින්ප්‍රාදේශීයලේකම් කාර්යාලයටගෙවාඇතිඅතරඑහිදිගුකාලීනබද්දටඑළඹීමටකටයුතුසැකෙසමින්පවතී. 2021 ඔක්තෝබර් 22 දින වර්තමාන තත්වය පිලිබඳ ඉල්ලා ඇත.

**<u>රත්නපුර</u>**

සියළු ලිපිලේඛන රත්නපුර ප්‍රාදේශීයලේකම්කාර්යාලය වෙත යවා ඇති අතර බද්ද පමණක් නිදහස් කිරීමට ඇත. 2021 මැයි 17 දින සිහිකැඳවීමක් යවා ඇති අතර 2021 ජුනි 25 දින ප්‍රාදේශීයලේකම්විසින් එයට ප්‍රතිචාර දක්වමින් එහි අවසන් කටයුතු සිදුකෙරෙමින් පවතින බව සඳහන් කර ඇත. 2021 ඔක්තෝබර් 22 දින වර්තමාන තත්වය පිලිබඳ ඉල්ලා ඇත.

## 3.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්චස් 38.8 ක ඉඩමක් 2008 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 50 ක කාලයක් සඳහා බදු පදනම මත ලබා ගෙන තිබුණ ද මෙම ඉඩම පසුගිය වසර 11තුළ ඵලදායී අරමුණක් සඳහා භාවිතා කර නොතිබුණි. | බැංකුවේ මෙහෙයුම් සඳහා භාවිතා කිරීමට මෙම පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලක් වැඩි දියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. කෙසේ වෙතත් රජය විසින් නව ගොඩනැගිලි ව්‍යාපෘති 2022 වර්ෂය දක්වා නැවැත්වීමට තීරණය කර තිබීම හා එබැවින් මෙම ව්‍යාපෘතිය කල්දැමීමට ආයතනික කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණි. | බැංකුව විසින් විශේෂ අරමුණක් ඇතිව ඉඩමක ආයෝජනය කළයුතුය. |

## 3.6 මානව සම්පත් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 01 | 2020 වර්ෂය අවසානයට අධ්‍යක්ෂ මණ්ඩලයඅනුමත 5,408 ක් වන කාර්ය මණ්ඩලය අතරින් 748 ක් පුරප්පාඩුව තිබුණි.<br>අ.විධායක කාර්ය මණ්ඩලය 2,502 අතරින් 660 ක් හෙවත් සියයට 26 ක් පුරප්පාඩු වන අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් 5 ක්, සහකාර සාමාන්‍යාධිකාරිවරුන් 6 ක් , ප්‍රධාන කළමනාකරුවන් 28 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 10 ක්, කළමනාකරුවන් 13 ක් සහ සහකාර කළමනාකරුවන් 140 ක් ඇතුලත් වේ. මෙය බැංකුවේ සුමට මෙහෙයුම් කටයුතු සඳහා බලපා තිබුණි.<br>ආ. වර්ෂය අවසානයට III-IIIශ්‍රේණියේ අනුමත කාර්ය මණ්ඩලය(1,043) අතරින් 430 ක් පුරප්පාඩුව පැවතුණි.<br>ඇ. 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයෙන් විධායක නොවන කාර්ය මණ්ඩල සහකාර (VIශ්‍රේණිය) තනතුරු සංඛ්‍යාව සියයට 38 කි. 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 229 ක් හා පුරප්පාඩු තනතුරු 66 ක් ඇතුලත්ව තථ්‍ය කාර්ය මණ්ඩලය 2,000 ක් වේ. | 2019 වර්ෂයේදී ජනාධිපතිවරණය හා 2020වර්ෂයේදී මහමැතිවරණය ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් ඉතිරි පුරප්පාඩුපිරවීම ප්‍රමාද විය.තවද Covid-19 වසංගතතත්වය හේතුවෙන් බඳවා ගැනීම් සඳහා වන සම්මුඛ පරීක්ෂණ සහ උසස්වීම් කල්දමන ලදී. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුල උසස්වීම් 3 ක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ශ්‍රේණිය) වෙත ලබා දෙන ලදී. 2020 වර්ෂය තුල III-II ශ්‍රේණියේ උසස්වීම් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වන ලදී. 2021 වර්ෂය තුල III-III ශ්‍රේණියට හා III-II ශ්‍රේණියට උසස්වීම් ලබා දෙන ලදී. | බැංකුවේ පුරප්පාඩු සාධාරණ කාලයක් තුල පිරවීමට කටයුතු කළ යුතුය. |
| 02 | බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය වර්ෂයෙන් වර්ෂයට වෙනස් වේ. පසුගිය වර්ෂ 5 ඇතුලත විධායක මට්ටමේ සහකාර සාමාන්‍යාධිකාරි සහ නියෝජ්‍ය | අංශ ප්‍රධානීන්ගෙන් ලබාගත් ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රවල අවශ්‍යතාවය පදනම් කරගෙන බැංකුවේ මිනිස්බලසැලැස්මවාර්ෂිකව වෙනස් | මිනිස්බලසැලැස්මට වාර්ෂිකව සිදු කරන වෙනස්කම් අනවශ්‍ය තනතුරු |

සාමාන්‍යාධිකාරී තනතුරුවල අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පහත ආකාරයෙන් වෙනස් වී තිබුණි.

| තනතුර | 2020 | 2019 | 2018 | 2017 | 2016 |
|---|---|---|---|---|---|
| ජෙ.නි.සා. | 02 | 02 | 02 | 02 | 02 |
| නි.සා. | 12 | 12 | 13 | 13 | 13 |
| සහ.සා. | 26 | 26 | 21 | 19 | 24 |

අ.2017 වර්ෂයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) , අවදානම් කළමනාකරණ ප්‍රධානී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වත්කම් කළමනාකරණ ) ස්ථිර කාර්ය මණ්ඩලයෙන් ඉවත් කර තිබූ අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ උපදේශක (භාණ්ඩාගාර- කොන්ත්‍රාත් පදනම) කාර්ය මණ්ඩලයට එකතු කර තිබුණි.

කරනු ලබයි.
ඒ අනුව මිනිස්බලසැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වාර්ෂිකව ලබා ගනී. මෙලෙස සඳහන් කරන ලද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරුවල ඉවත් කිරීම් හා එකතු කිරීම් බැංකුවේමෙහෙයුම් අවශ්‍යතා පදනම් කරගෙන සිදු කර ඇත.

සෑදීමට හා අසාමාන්‍ය බඳවාගැනීම් සිදුකිරීමට හේතු විය හැක.එම නිසා බැංකුව මේ සම්බන්ධයෙන් ඵලදායී පාලන ක්‍රම පවත්වා ගත යුතුය.

ආ.2017 වර්ෂයේ සිට අවදානම් කළමනාකරණ ප්‍රධානීතනතුර කාර්ය මණ්ඩලයෙන් ඉවත් කර තිබූ අතර වර්තමානයේදී සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම්)විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ කටයුතු පවත්වාගෙන යනු ලබයි.බැංකුව විසින් ස්වාධීන ප්‍රධාන කළමනාකරණ තත්වයේ ප්‍රධාන අවදානම් නිලධාරී තනතුරක් ස්ථානගත කොට බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කර නොතිබුණි. විගණන, මූල්‍ය, back office, සහ වෙනත් පාලන කාර්යයන් වැනි ස්වාධීන රේඛීය වාර්තාකරණයක් අවදානම් කළමනාකරණ කාර්යයට අවශ්‍ය වේ.

2013 වර්ෂයේදී ප්‍රධාන කළමනාකරු (අවදානම් කළමනාකරණ) තනතුරට පත් කළ නිලධාරියා 2018 මැයි 01 දින සිට සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) තනතුරට උසස් කරන ලදී. එම නිලධාරියා 2018ඔක්තෝබර් 01 දින සිට ප්‍රධාන අවදානම් නිලධාරී තනතුරට පත් කරන ලදී. ප්‍රධාන අවදානම් නිලධාරී
බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පුද්ගල ගණයට අයත් වේ. ඒ අනුව එය 2019 බැංකු පනතේ නිර්ණය 01 ට අනුකූල වේ.

ඵලදායී ස්වාධීනත්වය සඳහා බැංකුවේ ඉහළ මට්ටමේ තනතුරක් ලෙස ප්‍රධාන අවදානම් නිලධාරී තනතුර ට පත් කළ යුතුය.

ඇ.වර්ෂයෙන් වර්ෂයට පහත පරිදි ස්ථිර කාර්ය මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු වෙනස් කර තිබුණි.

| **තනතුර** | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|---|---|
| සහ.සාමා. (මෙහෙයුම්/ප්‍රාදේශීය) | 3 | 2 | 3 | 1 | 5 |
| සහ.සාමා. | 2 | 2 | 2 | 3 | 2 |

අංශ ප්‍රධානීන්ගෙන් ලබාගත් ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රවල අවශ්‍යතාවය පදනම් කරගෙන බැංකුවේ මිනිස්බලසැලැස්ම වාර්ෂිකව වෙනස් කරනු ලබයි.
ඒ අනුව මිනිස්බලසැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වාර්ෂිකව ලබා ගනී. මෙලෙස සඳහන් කරන ලද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරුවල ඉවත් කිරීම් හා එකතු කිරීම් බැංකුවේමෙහෙයුම් අවශ්‍යතා පදනම්

මිනිස්බලසැලැස්ම ට වාර්ෂිකව සිදු කරන වෙනස්කම් අනවශ්‍ය තනතුරු සෑදීමට හා අසාමාන්‍ය බඳවාගැනීම් සිදුකිරීමට හේතු විය හැක.එම නිසා බැංකුව මේ සම්බන්ධයෙන්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | (සිල්ලර ණය/අය කිරීම්/ණය) | | | | | | කරගෙන සිදු කර ඇත. | ඵලදායි පාලන ක්‍රම පවත්වා ගත යුතුය. |
| | සහ.සාමා. (නීති) | 1 | 0 | 1 | 1 | 1 | | |
| | සහ.සාමා. (වෙළඳ) | 1 | 0 | 0 | 1 | 0 | | |
| | සහ.සාමා. (තොරතුරු තාක්ෂණ) | 3 | 2 | 2 | 3 | 2 | | |
| | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ.සාමා. (මුල්‍ය හා සැලසුම්) | 1 | 0 | 0 | 1 | 1 | | |
| | සහ.සාමා. (සහායක සේවා) | 1 | 1 | 1 | 1 | 0 | | |
| 03 | ශාඛාවල අවශ්‍යතාවය පදනම් කරගත් නිසි මාරුකිරීම් ප්‍රතිපත්තියක් බැංකුවට නැත.එහෙයින් ශාඛා කාර්ය මණ්ඩල ඔවුන්ගේ උපන් ප්‍රදේශවලට මාරු කිරිම හේතුවෙන් ශාඛාවල පුරප්පාඩු වැඩිවී ඇත. කාර්ය මණ්ඩලයේ පෞද්ගලික අවශ්‍යතා සලකමින් මාරු කිරීම් සිදු කලද,බඳවා ගන්නා අවස්ථාවේදී දිවයින පුරා වැඩකිරීමට කැමැත්ත ලබාගෙන ඇත. | | | | | | බැංකුවේ අනුමත මාරුකිරීම් ප්‍රතිපත්තියක් ඇත. එම මාරුකිරීම් ප්‍රතිපත්තිය අනුව, බැංකුව විසින් පිළිවෙලින් 2017 හා 2018 වර්ෂයන්හිදී IVශ්‍රේණියේ හා ඉන් පහළ සේවකයන් 318 දෙනෙකු සහ එකම ස්ථානයේ වර්ෂ 5 ක් සම්පූර්ණ කළ සේවකයන් 209 දෙනෙකු මාරු කර ඇත.2020 වර්ෂය ඇතුලත Covid-19 වසංගතතත්වය හේතුවෙන්වර්ෂ 5 න්මාරුකිරීම් බලනොපාන ලදී.<br>කෙසේ වෙතත් , III-III ශ්‍රේණියට හා III-II ශ්‍රේණියට කළ උසස්වීම් ඇතුලත්ව සේවකයන් 268 දෙනෙකු සහ එකම ස්ථානයේ වර්ෂ 5 ක් සම්පූර්ණ කළ IV සහ VIශ්‍රේණිවල සේවකයන් 374 දෙනෙකු 2021 වර්ෂයේදී මාරු කර ඇත.<br>බැංකුවේ තථ්‍ය අවශ්‍යතාවය සලකා බලා මාරුකිරීම් කරනු ලැබේ.තවද, මාරුකිරීම් සිදු කිරීමේදී සේවකයන්පිටස්තර ශාඛාවල දිගු කාලයක් සේවය කර ඇති විට,ඔවුන්ගෙන් බැංකුවට වන දායකත්වයට බලපෑමක් ඇතිවිය හැකි බැවින් එම සේවකයන්ගේ අභියාචනා/දුක්ගැනවිලිද සැලකිල්ලට | බැංකුව විසින් බැංකුවේ අවශ්‍යතාවයට දැඩි ලෙස අනුකූල විය යුතු අතර මාරුකිරීම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කළ යුතුය. |

<table>
<tr><td></td><td></td><td>ගනු ලැබේ.</td><td></td></tr>
<tr><td>04</td><td>අ. සැලකිය යුතු කාලයක සිට පහත දැක්වෙන ප්‍රධාන කළමනාකරණ තනතුරු වෙනත්ප්‍රධාන කළමනාකරුවන් විසින් ආවරණය කරනු ලැබේ.
<table>
<tr><th>පුරප්පාඩු තනතුර</th><th>කාර්යයන් ආවරණ තනතුර</th><th>ආවරණ පත්වීමේ දිනය</th></tr>
<tr><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුල්‍ය )</td><td>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි</td><td>2020.09.22 අංක 1950/2020 දරණසාමාන්‍යාධිකාරි චක්‍රලේඛය</td></tr>
<tr><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර)</td><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ණය)</td><td>2020.10.19 අංක 06/2020 දරණ සභාපතිතුම්යගේ චක්‍රලේඛය</td></tr>
<tr><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම්)</td><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(වෙළඳ)</td><td>2020.10.12 අංක 04/2020 දරණ සභාපතිතුමියගේ චක්‍රලේඛය</td></tr>
</table></td><td>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර) තනතුරු 2021 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත කාර්ය මණ්ඩලයේ නැත.<br>ඒ අනුව, විශේෂ ශ්‍රේණියේ වැඩබලන තනතුර, වැඩබලනනියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුල්‍ය, ආයතනික සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති) පමණක් වේ.</td><td>අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා ස්ථිර පත්වීම් සිදු කළ යුතුය.</td></tr>
<tr><td></td><td>ආ. වැඩබලන තනතුරු හා ආවරණ තනතුරු සඳහා අනුමැතිය ලබාදීමේදී බැංකුව විසින් ස්ථිර ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.උදා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන),නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර)සභාපතිතුමියගේ චක්‍රලේඛය හරහා පත්කර තිබූ අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුල්‍ය )සාමාන්‍යාධිකාරි චක්‍රලේඛය හරහා පත්කර තිබුණි.ඊට අමතරව,නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(තොරතුරු තාක්ෂණ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර තිබුණි.</td><td>අනුමත මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත අනුව, බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරකට සිදුකරන ඕනෑම වෙනස්කමක් සාමාන්‍යාධිකාරි චක්‍රලේඛයක් මගින් සන්නිවේදනය කළ යුතුය.ඉදිරියේදී මෙය පරිශීලනය කෙරේ.</td><td>මානව සම්පත් අංශය විසින් මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත අනුගමනය කළ යුතුය.</td></tr>
<tr><td></td><td>ඇ. 2006 අංක 6 දරන මුල්‍ය ගණුදෙනු වාර්තාකරන පනතේ 17 වගන්තිය අනුව, සියළු මුල්‍ය ආයතන අනුකූලතා නිලධාරි තනතුර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරියෙකු පත් කළ යුතු අතර ඔහු/ඇය මුල්‍ය ආයතනයේ අනුකූලතාවය</td><td>අනුමත මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත අනුව, බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරකට සිදුකරන ඕනෑම වෙනස්කමක් සාමාන්‍යාධිකාරි චක්‍රලේඛයක් මගින් සන්නිවේදනය කළ යුතුය.ඉදිරියේදී මෙය පරිශීලනය</td><td>අනුකූලතා නිලධාරිඅනෙකුත් අංශ ප්‍රධානීන් ට වඩා පහළ තනතුරක සිටීම හේතුවෙන් නිසි</td></tr>
</table>

| | | |
|---|---|---|
| සමග පනතේ අවශ්‍යතාවයන් සහතික කිරිම වෙනුවෙන් වගකිව යුතුවේ. අනුකූලතා නිලධාරි වෙත සියළු ගණුදෙනුකරුවන්ගේ වාර්තා හා වෙනත් අදාල තොරතුරු සඳහා ඉක්මන් ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරිම ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරිමට අවශ්‍ය විය හැක.කෙසේ වෙතත් , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මට්ටමේ හෝ ප්‍රධාන අනුකූලතා නිලධාරියකු පත් කිරීමෙන් තොරව සහකාර සාමාන්‍යාධිකාරිවරයකු පත් කර බැංකුව විසින් බැංකුවේ සියළු අනුකූලතා කටයුතු පවත්වා ගෙන ගොස් ඇත. | කෙරේ.<br><br>2013 වර්ෂයේ නොවැම්බර් 18 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුවට අනුකූලතා නිලධාරියෙකුබඳවාගෙන ඇත. ඇය 2013 වර්ෂයේ නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සහකාර සාමාන්‍යාධිකාරි (විශේෂ ශ්‍රේණිය ) තනතුරකට උසස් කර ඇත.<br>2019 බැංකු පනතේ නිර්ණය 01 හි නියමයන්ට අනුව විධායක තනතුරු දරන නිලධාරීන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාවය තක්සේරු කිරිම මතළුම තනතුරු දරන අතිරේක සාමාන්‍යාධිකාරි, ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරි,ප්‍රධාන අවදානම් නිලධාරිසහඅනුකූලතා නිලධාරි බලපත්‍රලාභී බැංකුවක විධායක කාර්යයන් ඉටුකරන නිලධාරීන් බවට තීරණය කෙරේ.<br>තවද,අනුකූලතා නිලධාරිප්‍රධාන කළමනාකරණ තනතුරක් ලෙස සලකන අතර එය බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.එබැවින් අනුකූලතා නිලධාරි බැංකුවේ ස්වාධීන ප්‍රධාන කළමනාකරණ තනතුරක් දරයි. | ස්වාධීනත්වයක් පවත්වාගෙන යා නොහැක. එහෙයින් අනුකූලතා නිලධාරි ඉහලතනතුරක ස්ථානගත කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිතාවය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ අංශය මගින් වර්ග 12 ක තැන්පතු සැලකිල්ලට නොගැනීම නිසා 2020 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව සහ තොරතුරු තාක්ෂණ අංශයෙන් ලබාගත් තොරතුරු අතර ස්ථාවර තැන්පතු ශේෂයේ රු.422,831,641 ක වෙනසක් තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර තැන්පතු ශේෂය නිවැරදිය. | තීරණ ගැනීම සඳහා ඕනෑම කාලයක තොරතුරු පද්ධතියෙන් ලබාගන්නා තොරතුරු නිවැරදි විය යුතුය. |